සැ. යු. — 2012.10.05 දින පළ වූ අංක 1,779 දරන ගැසට් පත්‍රයේ III සහ IV (අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,780 - 2012 ඔක්තෝබර් මස 12 වැනි සිකුරාදා - 2012.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1512 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 නොවැම්බර් මස 02 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ඔක්තෝබර් මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

බී. කේ. එස්. රවීන්ද්‍ර,
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2012 ජූනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1511- B 80655 — 7,200 (2012/10)
F1-

# පළාත් සභා නිවේදන

**1946 අංක 57 දරන පුද්ගල හා පොදු සුසාන පිළිබඳ ආඥාපනතේ III පරිච්ඡේදයේ 33 වගන්තිය යටතේ සුසාන භූමියක් ප්‍රකාශයට පත් කිරීම**

1946 අංක 57 දරන පුද්ගල හා පොදු සුසාන පිළිබඳ ආඥාපනතේ III වැනි පරිච්ඡේදයේ 33 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළයේ, මැද පළාතේ, මුදුකටුව ග්‍රාම නිලධාරී වසමේ, මුදුකටුව ගමේ පිහිටි ඩබ්ලිව්. ලක්ෂ්මන් එච්. ප්‍රනාන්දු බලයලත් මිනින්දෝරු විසින් වර්ෂ 2012.04.26 දින මැන සාදන ලද අංක 10764 දරන පිඹුරේ කැබලි අංක 01 දරන උතුරු සහ නැගෙනහිර මායිමේ පිඹුරුපත් අංක 4591 B හි කැබලි අංක 3 B කොටස ද, දකුණු මායිමේ බෙනඩික් ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම හා පාතිමා දේවස්ථාන භූමිය ද, බස්නාහිර මායිමේ පාතිමා දේවස්ථානය ද අඩි 18ක් පළල මාර්ගය හා කැබලි අංක 3 B කොටස ද, දැක්වෙන පර්චස් 30 භූමි භාගය තුළ, මුදුකටුව පාතිමා අප ස්වාමිදුවගේ දේවස්ථානයේ රෝමානු කතෝලික බැතිමතුන් වෙනුවෙන් සුසාන භූමියක් පවත්වාගෙන යාම මා විසින් අනුමත කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

අතුල සරත් කුමාර විජේසිංහ,
ප්‍රධාන අමාත්‍ය හා මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය,
පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල, අධ්‍යාපන හා
සංස්කෘතික කටයුතු, ඉඩම්, ප්‍රවාහන, පරිසර, සංචාරක, ආයෝජන
සම්බන්ධීකරණ, සමුපකාර සංවර්ධන හා ආහාර සැපයුම් හා
බෙදාහැරීමේ අමාත්‍ය,
(වයඹ පළාත)

2012ක් වූ අගෝස්තු මස 27 වැනි දින,
කුරුණෑගල දී.

10-445

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.